# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එක්සත් මුස්ලිම් උම්මාහ්
## (සංස්ථාගත කිරීමේ)

**එක්සත් මුස්ලිම් උම්මාහ් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හුනෛයිස් ෆාරුක් මහතා විසින්
2013 ජනවාරි මස 09 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 දෙසැම්බර් මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[200 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# එක්සත් මුස්ලිම් උම්මාහ්
# (සංස්ථාගත කිරීමේ)

## එක්සත් මුස්ලිම් උම්මාහ් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"එක්සත් මුස්ලිම් උම්මාහ්" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී ආයතනයට, සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී ආයතනය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2013 අංක    දරන එක්සත් මුස්ලිම් උම්මාහ් (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

එක්සත් මුස්ලිම් උම්මාහ් සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) එක්සත් මුස්ලිම් උම්මාහ්හි දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවන ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "එක්සත් මුස්ලිම් උම්මාහ් " යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජාතික සමෝධානය ගොඩනැංවීමට ක්‍රියා කිරීම ;

(ආ) සැබෑ බහුත්වවාදී සමාජයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම සඳහා ක්‍රියා කිරීම ;

2- PL 006797 -75 (2012/11)

(ඇ) විවිධ සමාජ කොටස් අතරේ පැහැදිලි අන්‍යෝන්‍යතාවයක් ඇති කිරීම හා සමගි සහජීවන මිත්‍රත්වයක් ඇති කිරීම සඳහා උනන්දු කිරීම;

(ඈ) මුස්ලිම් සමාජය තුළ එක්සත්කම ඇති කිරීම සඳහා උත්සාහ කිරීම;

(ඉ) ශ්‍රී ලංකාවේ සමාජ හා ආර්ථික දියුණුවට උදවු කිරීම;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි නිරතව සිටින ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර කිරීම;

(උ) ශ්‍රී ලංකාව තුළ ප්‍රජා සුභසාධන, අධ්‍යාපනික සහ සමාජ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි නිරත වීම ;

(ඌ) අධ්‍යාපනය, සෞඛ්‍ය, ක්‍රීඩා, සංස්කෘතික අංග හා කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම සහ දැනුම දියුණු කිරීම, ව්‍යාප්ත කිරීම, ප්‍රචාරය කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මූල්‍යාධාර සැපයීම සහ ආයතන පිහිටුවීම ; සහ

(එ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය, හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවල විධිවිධාන සලස්වා තිබෙන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරන සභාවක් වෙත මේ පනතේ විධිවිධානවලට තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම අරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ කළමනාකරණ සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා කාරණා හෝ දේ කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) අරමුදල් රැස් කිරීම සහ දේශීය හෝ විදේශීය කවර හෝ ප්‍රභවයකින් මුදලින් හෝ ද්‍රව්‍යයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමට;

(ආ) චංචල හෝ නිශ්චල දේපල කවර හෝ ආකාරයකින් අත් කරගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළහැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීම, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) මේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට ඇතුළත් වීම ; සහ

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත් කර ගැනීම සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සභාවේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය ;

(ඉ) සංස්ථාවේ හා සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනිම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විටම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක වූ පදනමේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්

7. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය;

(3) සංස්ථාවේ ගිණුම් සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක, එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංස්ථාව ලාබ නොබලන සංවිධානයක් විය යුතුය.

8. කවර ප්‍රභවයකින් ව්‍යුත්පන්න වුව ද, සංස්ථාවේ මුදල් සහ දේපල හුදෙක් ම මෙහි සඳහන් කර ඇති සංස්ථාවේ පරමාර්ථ නංවාලීම උදෙසා යොදා ගත යුතු අතර, ඉන් කිසිම කොටසක්, සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ, ණය, ප්‍රසාද මුදල් හෝ වෙනත් කවර වුවද ආකාරයට ලාභ වශයෙන් කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම කරනු නොලැබිය යුතු ය :

එසේ වුවද, මේ වගන්තියේ විධිවිධාන මගින් —

(අ) සංස්ථාවේ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සංස්ථාවට කරන ලද යම් සේවාවක් වෙනුවෙන් සද්භාවයෙන් යම් සාධාරන සහ නිසි පාරිශ්‍රමිකයක් ඔහුට ගෙවීම ;

(ආ) සංස්ථාවේ යම් සාමාජිකයකු විසින් හෝ සංස්ථාවේ සාමාජිකයකු යම් සමාගමක කොටස්කරුවකු වන අවස්ථාවක ඒ සමාගම විසින්, සංස්ථාවට කුලියට දෙන ලද ස්ථානයක් සඳහා සාධාරන නිසි කුලියක් ගෙවීම ; සහ

(ඇ) තම කටයුතු හෝ කාර්ය ඉටු කිරීමෙහි ලා හෝ සංස්ථාවේ පරමාර්ථ නංවාලීමෙ හි ලා සංස්ථාවේ යම් සාමාජිකයකු නිලධරයකු හෝ සේවකයකු විසින් කළමනාකරණ මණ්ඩලයෙන් කලින් ලබා ගන්නා ලද අනුමැතිය ඇතිව දරන ලද යුක්තිසහගත හා නිසි වියදම් ආපසු ගෙවීම හෝ පියවීම.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුවද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**10.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.